᠌# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/9 - 2020 ජනවාරි මස 07 වැනි අඟහරුවාදා - 2020.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xvi)(ඒ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23(2) වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2020 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2019 මැයි මස 8 වන දින අංක 2122/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත පරිදි වූ, 1990 ජනවාරි මස 5 වන දින අංක 591/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ 16 වන ඡෙදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) (2) වන අනුඡෙදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(2) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(i) නීති අධ්‍යයනය ;
(ii) භාෂා අධ්‍යයනය ;
(iii) සමාජ අධ්‍යයනය ; සහ
(iv) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම.";

(2) (3) වන අනුඡෙදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(3) ස්වභාවික විද්‍යා පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය:-

(i) උද්භිද විද්‍යාව ;
(ii) රසායන විද්‍යාව ;
(iii) ගණිතය ;
(iv) පරිගණක විද්‍යාව ;
(v) භෞතික විද්‍යාව ; සහ
(vi) සත්ව විද්‍යාව.";

(3) (5) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(5) අධ්‍යාපන පීඨයෙහි පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය :-

(i) ද්විතීය සහ තෘතීය අධ්‍යාපනය ;
(ii) පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය ;
(iii) විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය ;
(iv) අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය.";

01 - 555

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.